Vidyodaya Journal of Humanities and Social Sciences

VJHSS (2024), Vol. 09 (02)

# Negative Aesthetic Expression of Sinhala Literary Identity: An Analytical Study with Reference to Sigiri Graffiti

G. A. H. Viranga
Faculty of Graduate Studies, University of Sri Jayewardenepura, Sri Lanka

**Article Info**

Article History:
Received 11 Feb 2024
Accepted 24 June 024
Issue Published Online
01 July 2024

**Key Words:**
Undefinable
Negative Aesthetic Expression
Independent Sinhala Poetry
Sigiri Poetry

*Corresponding author
E-mail address:
hashanviranga24@gmail.com

https://orcid.org/0009-0005-2287-9807

Journal homepage:
http://journals.sjp.ac.lk/index.php/vjhss

http://doi.org/10.31357/fhss/vjhss.v09i02.06

VJHSS (2024), Vol. 09 (02), pp. 93-101

ISSN 1391-1937/ISSN 2651-0367 (Online)

CC BY
Faculty of Humanities and Social Sciences 2024

## ABSTRACT

*This research studies the negative aesthetic expression of Sinhala poetry. The practical implication of this study is to lucidly identify the thinking pattern of Sinhala society and aestheticism and add value to Sinhala literature. This study was conducted, taking Sigiri graffiti as the unit of analysis, considering the Sinhalese poet's desire to create a dignified artistic sense via negative expression. Negative aesthetic expression is conceptualized in this study as a unique characteristic of Eastern aestheticism based on the undefinable, unthinkable and indefinite nature of person and the world. This research was a qualitative study and the data was analyzed via the content analysis method under analytical study methodology. The case study of this research is the preference for the negativity which appears in Hajime Nakamura's Ways of Thinking of Eastern Peoples: India, China, Tibet, Japan (1969). The research problem is to study the aesthetic logic of negative expression of Sigiri graffiti which is the independent social poetic tradition in Anuradhapura era. The hypothesis is that there is a preference of negative aesthetic in Sigiri poetic tradition; the independent Sri Lankan poetry. Among the objectives, the Sigiri poetry will be analyzed through a novel approach. The famous Sigiri poem by Budal, manifests the undefinable and unthinkable thinking. The originality of this research is unraveling the fact that preference of negativity prevailed as an aesthetic thinking pattern in Sinhala poetry from a long time. As the conclusions, it was unveiled that negative expression is evident in 2/3rd of 686 Sigiri graffiti. In several poetry the preference negative aesthetic expression was evident in literary poetic techniques like irony, simile and metaphors.*

## මාතෘකාව

නිෂේධනාර්ථවාදී සෞන්දර්ය ජනනයෙහි සිංහල සාහිත්‍ය අනන්‍යතාව; සීගිරි කාව්‍ය පදනම් කර ගත් විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

## 1. හැඳින්වීම

මෙම පර්යේෂණය පෙරදිග චින්තන ක්‍රමයේ විශේෂ ලක්ෂණයක් වන නිෂේධනාර්ථවාදී ළැදියාව සෞන්දර්ය චින්තන ප්‍රකාශනයක් වශයෙන් සීගිරි ගීවලින් ප්‍රකාශයට පත් වී තිබීම පිළිබඳ අධ්‍යයනයකි. නිෂේධන ළැදියාව යනු සාමාන්‍ය භාෂා ව්‍යවහාරයක දී නැත යනුවෙන් දැක්වීම නොව පෙරදිගට අනන්‍ය මානව භාෂා චින්තන විධියකි. පෙරදිග මිනිසුන්ගේ විශේෂ චින්තන ඇබ්බැහියක් වශයෙන් හජිමෙ නකමුරා (1912 - 1999) මෙම නිෂේධන ළැදියාව (1964) සාකච්ඡා කර තිබේ. මෙකී පර්යේෂණයේ න්‍යායාත්මක රාමුව වශයෙන් සිද්ධි අධ්‍යයනයක් පදනම් කර ගැනිණි. නකමුරා විසින් නැගෙනහිර ආසියාතික ප්‍රධාන රටවල් හතරක් පර්යේෂණ ක්ෂේත්‍රය වශයෙන් භාවිත කරමින් පෙරදිග මිනිසුන්ගේ චින්තන විධි පිළිබඳ පොදු සංකල්පීයකරණයක් ඉදිරිපත් කරන ලදි. මෙම පර්යේෂණයේ සිද්ධි අධ්‍යයනය වශයෙන් පදනම් කරගන්නේ හජිමෙ නකමුරාගේ පෙරදිග මිනිසුන්ගේ චින්තන විධි (1964) කෘතියේ නිෂේධන ප්‍රියතාව පිළිබඳ සංකල්පයයි. පෙරදිග මිනිසුන්ගේ චින්තන විධි අතර එක් චින්තන විධියක් වශයෙන් දක්වන නිෂේධනයෙහි සාහිත්‍ය භාවිතයක් වශයෙන් පවත්නා උපයෝගීභාවය මෙහි දී සාකච්ඡාවට ලක් කෙරේ. එය සිංහල සාහිත්‍යයට අනන්‍ය ලක්ෂණයක් ද යන්න මෙතෙක් පර්යේෂණයට ලක් කර නොමැති අතර එය පර්යේෂණ හිදැස වශයෙන් යොදා ගැනිණ. නකමුරා දක්වන සංකල්පය පිළිබඳ ව්‍යවහාරික අධ්‍යයනයක් සීගිරි කවි ආශ්‍රය කරගෙන මෙම පර්යේෂණයේ දී සිදු කරනු ලැබිණ. භාරතීය ප්‍රධාන දර්ශන නිකායන් විශ්වීයත්වය (Universal) පිළිබඳ උපකල්පනයන් හා ගවේෂණයන්හි අවසාන නිගමන වෙතට පැමිණීමේ දී අචින්ත්‍ය වූ හා අනිර්ණේය පරමාදර්ශ වෙතට ළඟා වන බව නකමුරා දක්වයි (නකමුරා, 2010).

විශේෂයෙන් භාෂාව පිළිබඳ විග්‍රහයෙන් ම මෙම නිෂේධන ප්‍රියතාව විග්‍රහ කිරීම නකමුරා ආරම්භ කරයි. පෙරදිග ප්‍රධාන භාෂාවල නාම පදයේ භාවාතිශය බව පිළිබඳ නැඹුරුව ඔහුගේ අවධානයට ලක් වෙයි. තව ද භාෂාවේ නිෂේධනීය ස්වරූපය අනුව උදාහරණ වශයෙන් සංස්කෘත භාෂාවේ අනේක, අප්‍රමාද, අවෛර, අහිංසා, අස්තෙය (සොරකම් නොකිරීම) යන වචනවල ගොඩනැගීම ආශ්‍රය කරගෙන නිෂේධනාර්ථය ඔහු විසින් පැහැදිලි කොට තිබේ (එම, 61,62 පි.). නකමුරා පෙරදිග හා අපරදිග භාෂාවල ස්වරූපය ආශ්‍රය කරගෙන සිය විග්‍රහයට පදනම සපයනුයේ මෙසේ ය. "භාරතීයයන් භාෂාවල ඇති 'Victory or defeat' හෝ 'victory or draw' හෝ වැනි අදහසක් ඒ නයින් ඉදිරිපත් කරනු වෙනුවට ඉදිරිපත් කරනුයේ ජයාජයෞ (ජය+අජය) වශයෙනි. වෙනත් භාෂාවල ඇති 'many or none' වැන්නක් සඳහා අනේක (න+ඒක) වශයෙනි. නිෂේධන රූපය සහිත වචන නිෂේධනාර්ථය හෝ අභාවාර්ථය හෝ පමණක් නො ව අස්ත්‍යර්ථය ද (ඇත යන අරුත ද) දෙයි. භාරතීය මනස අනුව අප්‍රමාද, අවෛර, (වෛරයෙන් තොර බව), අහිංසා වැනි වදන් 'යත්නය', 'ක්ෂමාව', 'සමාදානය' වැනි වදන්වලට වඩා ධනාර්ථවත් වෙයි" (නකමුරා, 2004) ඊට අනුව භාරතීය භාෂාවන් නිෂේධන ප්‍රියතාව සමස්ත භාෂා සංස්කෘතිය පුරා අපරදිගට වඩා වෙනස් වෙමින් විහිදුවන බව හෙතෙම දක්වයි.

බ්‍රාහ්මණික යෝගාචර සම්ප්‍රදායේ ශිෂ්‍යයනට ද පොදු බව පසක් කළ යුතු ගුණදම් පසෙන් තුනක් ද නිෂේධනාර්ථය සපයන්නේ වෙයි. එනම් අහිංසා, අස්තෙය, අපරිග්‍රහ යන ඒවා ය (එම). මෙම තර්කය මෙන් ම බෞද්ධ පංචශීලයෙන් ද අවධාරණ වන්නේ විවිධ කාර්ය නොකිරීම් පහකි. බෞද්ධ විනය පිටකයේ අති විශාල ශික්ෂා පද ප්‍රමාණයකින් ද නිෂේධනාත්මක අර්ථ සැපයෙයි. මෙහි පවතින විශේෂතාව නම් බෞද්ධ හා හින්දු සම්ප්‍රදායන් දෙක සම්බන්ධයෙන් ද මෙම කරුණ සාකච්ඡා කිරීමේ දී නිෂේධනාර්ථයෙන් හුදෙක් නිෂේධනාත්මක බව පමණක් නොව ධනාත්මක බව ද මෙම සම්ප්‍රදායන් දෙක ම විසින් අවධාරණ කරන බව දක්වා තිබීමයි (එම). එබැවින් අනිත්‍ය, අනන්ත හා අනිර්ණේය සංකල්පය තහවුරු කිරීම බෞද්ධ හා හින්දු සම්ප්‍රදායන්ගේ ස්වරූපයක් වශයෙන් නකමුරා අවධාරණ කරයි. ධම්මපදයේ 46 වන ගාථාවේ එන "අදස්සනං මච්චුරාජස්ස ගච්ඡෙ" යන්න ද උපුටා දක්වන නකමුරා නිවනට පත් වන තැනැත්තා මාරයා නොසම්මුඛ වන බව දක්වමින් නිෂේධන වූත් අභාවවාචක වූත් මතය බෞද්ධ සංස්කෘතිය මතට ද ආරෝපණය කර දක්වයි. පෙරදිග වැසියා නිෂේධන සංකල්පය වෙත අභිරුචියෙන් යුක්ත බව පෙන්වා දී ඇත්තේ භාෂා තර්කනය මගින් යුරෝපීය භාෂා හා සංසන්දනය කර දක්වමිනි (එම, 62).

මෙම නිෂේධනාර්ථය සිදත් සඟරාවේ දී දක්වනුයේ අව්‍ය සමාසය පදනම් කර ගනිමින් ය. එනමුත් එම සමාසය පිළිබඳ ගැටලුකාරී මතවාද පවතී. මාතෘ භාෂාවට අනුව ගිය සිදත් සඟරා කතුවරයා සිංහලයට ද අව්‍ය සමාසය අන්තර්ග්‍රහණය කරවයි.

> "පෙර කඩ උසුරුවන
> යව් කු ප න ඇ අවියත්
> පර පද සබඳ ලදහොත්
> අවිය සමස් එ වියූ" (සිදත් සඟරාව, 2004).

අව්‍ය සමාසය සිදත් කතුවරයා හඳුන්වා දී ඇත්තේ පාලි සංස්කෘත භාෂාවලට අනුගත වන පරිදි බවත් එම සංස්කෘත හා පාලි භාෂාවල අව්‍යය පදයක් මුලින් යෙදීම පමණක් නොව අව්‍යය පදයේ අර්ථය ප්‍රධාන වීමත් අව්‍ය සමාසයේ දී අපේක්ෂා කරන බවත් දක්වන මුත් සිංහල භාෂාවේ දී හැමවිට ම අව්‍යය පදයේ අර්ථය ප්‍රධාන වීමක් අපේක්ෂා නොකරන බවත් ඔක්කම්පිටියේ පඤ්ඤාසාර හිමියෝ දක්වති (එම). සංස්කෘත භාෂාවේ 'අ' (අන්) යෙදෙන අයුරින් සීගිරි ගීවල නො යන්න යෙදී ඇති

බව සෙනරත් පරණවිතාන දක්වන්නේ මෙසේ ය. " 'නොයෙක්' (සං. (අනේක), 'නො-සන්දහන්', 'නො-ජත්', 'නො-දහම්', 'නො-කළ', 'නො-අසල' ආදියයි. මෙහි 'නො' යනු සංසකෘතයෙහි 'අ' (අන්) යන්න යෙදෙන අයුරින් යෙදී ඇත" (පරණවිතාන, 2009). මෙම නො සමාසය නකමුරාගේ නිෂේධනාර්ථය සපයන භාරතීය භාෂා පිළිබඳ තර්කයේ සිංහල උදාහරණය වේ. සීගිරි ගීවල නිෂේධනාර්ථ ගවේෂණයට මෙම සමාස භාවිතය පිළිබඳ දැනුම වැදගත් ය. එසේ ම තියඩෝර් ඇඩර්නෝගේ නිෂේධනාත්මක අපෝහකවාදය ද නිෂේධනය පිළිබඳ අපරදිග ඉදිරිපත් කර ඇති දාර්ශනික හා කලාත්මක වශයෙන් මැදිහත්වීමක් කර ඇති න්‍යායික ප්‍රවේශයකි (මෙලනි, 1997).

මහායානිකයන්ගේ ශූන්‍යතාවාදය ද නිෂේධන අර්ථයේ ලා තිරව දායක වේ. ක්‍රි. ව. 150-250 අතර මහායාන ආදිකර්තෘ නාගාර්ජුන හිමි ප්‍රතීත්‍යසමුත්පාදය වශයෙන් ඉදිරිපත් කරන අෂ්ට නිෂේධන පැහැදිලි  නිෂේධන ආකල්පය තිර ව දක්වයි. එනම් අනිරෝධ, අනුත්පාද, අනුච්ඡේද, අශාස්වත, අනේකාර්ථ, අනානාර්ථ, අනාගම, අනිර්ගම යන නිෂේධන ය (නකමුරා, 2004) මහායානිකයන්ගේ පරම සද්භාවය (Ultimate Reality) වන ශූන්‍යතාව අවබෝධය සඳහා සියලු ගුණයන්ගෙන් තොර මෙන්ම කාල්පනික නිර්ණායකයන්ගෙන් ද තොර ශූන්‍යතාව අවධාරණ කරයි (එම). උක්ත දාර්ශනික සාකච්ඡාවේ දී අසාරාර්ථ වූ ද නාස්තික වූ ද ප්‍රපඤ්චයක් අවධාරණ නොකරන බව ට ද අවධානය යොමු කළ යුතු වේ.

මෙම තත්ත්වය සහමුලින් ම ග්‍රීක චින්තනයේ දී වෙනස් වෙයි. ග්‍රීකයෝ දෘශ්‍ය විඥානය මත පදනම් ව වාස්තවික චින්තන ක්‍රමයෙන් ඉවත් නොවූ බව නකමුරා දක්වයි (එම). සංයුක්ත චින්තනය ග්‍රීක චින්තන විධිය වන බවත් වියුක්ත චින්තනය පෙරදිග චින්තන විධිය වන බවත් මේ අනුව දැක්විය යුතු ය. මුල් කාලීනව බුද්ධ ප්‍රතිමා නෙළීම කෙරෙහි පවා බෞද්ධයන් අතර ප්‍රියතාවක් නොවූ බවත් ඒ වෙනුවට සිරිපතුල නිර්මාණය කළ බවත් ඊට සපුරා වෙනස්ව ග්‍රීකයෝ මූර්ති ශිල්පය වැනි විෂයයන් දියුණු කර ගොඩනැගූ බවත් සියලු දෙයෙහි පැහැදිලි රූප දැකීම ප්‍රිය කළ බවත් නකමුරා පදනම් කරගෙන ඉදිරිපත් කළ හැකි තර්කනයකි (එම).

ලාංකේය සන්දර්භයේ දී මෙම තත්ත්වය සපුරා වෙනස් වන බව දැක්විය යුතු වේ. ඒ කෙසේ ද යත් බෞද්ධ පිළිගැනීම් මත පදනම් ව හින්දු විශ්වාස පද්ධතියට සපුරා වෙනස් චින්තන පද්ධතියක් ඊට අයත් වන හෙයිනි. බුදුදහම විවෘත ආගම් පද්ධතියක තත්ත්වය ආරක්ෂා කරගත් බව නකමුරා ද දක්වයි (එම). ගෞතම බුදුන්ගේ දේශනා පැහැදිලි ව ගුරුමුෂ්ටි නොමැති වූත් කිසිවකුගෙන් වසන් කර තබා නොගත යුතු වූත් ධර්මයක් වශයෙන් දක්වයි. "තථාගතයන් වදාළ විනය හා ධර්මය පැහැදිලි ආලෝකයක් විහිදයි. ඒවා රහසිගත ව නොපිළිපදිනු ලැබේ. ඒවා ඉර මඬල හා සඳ මඬල මෙන් ප්‍රකට ය. එ සේ ම තථාගතයන්ගේ ධර්මය සම්බන්ධ ගුරුමුෂ්ටි නොමැත" (එම). කෙසේ නමුත් නකමුරා දක්වන්නේ නොපැහැදිලි ප්‍රහේලිකා මගින් සිය අදහස් ප්‍රකාශනයෙන් බෞද්ධයන් පවා විනිර්මුක්ත නොවන බවයි.

උක්ත සිද්ධි අධ්‍යයනයේ සමාලෝචනයෙන් අපරදිග දාර්ශනික ප්‍රවණතාවක් වශයෙන් නිෂේධනයෙන් තොර නිර්ණය කළ හැකි ඥාතවත් වූ දැනුම් පද්ධතියක් කෙරෙහි විශ්වාසය තබන අතර පෙරදිග ඊට ප්‍රතිපක්ෂ වන බව ය. එ සේ ම එය සපුරා එක ම අදහසෙහි පෙරදිග අපරදිග සියලු දෙනා රැඳී සිටින බවක් ද ඉන් අදහස් නොවේ. විශේෂයෙන් බෞද්ධ මතය පෙරදිග අනෙකුත් බොහෝ පිළිගැනීම්වලින් වෙනස් වේ. නිෂේධනාර්ථවාදී සාකච්ඡාවේ දී අවධාරණ කළ යුතු නවමු ප්‍රපඤ්චයක් නාගාර්ජුන හිමි පාදක කරගෙන නකමුරා දක්වයි. එනම් ශුභ යන්න අශුභ යන්නෙන් පරායත්තව සාකච්ඡා කළ නොහැකි බවයි (නකමුරා, 2004). ඒ අනුව නිෂේධනාර්ථය අත්‍යවශ්‍යයෙන් ම අස්ත්‍යර්ථය හා සමීප සබඳතාවක් දක්වන්නේ වෙයි.

සාහිත්‍ය සංකල්පයක් වශයෙන් නිෂේධනාර්ථයේ භාවිතය රොමාන්තිකවාදී කවියකු වන ජෝන් කීට්ස් (1795-1821) විසින් ඉදිරිපත් කර තිබේ. ඔහු විසින් සිය සහෝදරයන් දෙදෙනා වන තෝමස් කීට්ස්ට සහ ජෝර්ජ් කීට්ස්ට 1817 දෙසැම්බර් 27 දින ලියන ලද ලිපියකින් නිෂේධනාර්ථවාචී හැකියාව (Negative Capability) පිළිබඳ පළමුව දී අදහස් දක්වන ලදි (Starr, 1966). නිෂේධනාර්ථවාදී එළඹුමකින් යුතු සාහිත්‍යකරුවා හෝ සම්ප්‍රදාය මමත්වයෙන් තොර වීම මෙන් ම තමා පිළිබඳ අධිතක්සේරුවක් ජනිත කිරීම ද නොකරයි. අපරදිග සාහිත්‍යයෙහි විලියම් ශේක්ස්පියර් සහ ජෝන් කීට්ස්ගේ සාහිත්‍යයේ ද මෙම නිෂේධනාර්ථවාදී එළඹුම දක්නා ලැබෙයි. එය නිෂේධනාර්ථවාදී හැකියාව වශයෙන් හැඳින්වීමට ජෝන් කීට්ස් පෙළඹී සිටීම විශේෂ අවධානයකට ගත යුතු වෙයි (Lau, 2006). මේ අනුව නිෂේධනාර්ථය පිළිබඳ උක්ත දැනුම මත පදනම් වෙමින් සිංහල සාහිත්‍යයේ වැඩි ම කවීන් හා කාව්‍ය ප්‍රමාණයක් හිමි සීගිරි කාව්‍ය පදනම් කරගෙන මෙම අධ්‍යයනය සිදු කෙරුණි. තත් පර්යේෂණයේ විසඳා ගැනීමට අවශ්‍ය වූ පර්යේෂණ ප්‍රශ්නය වූයේ පෙරදිග සංස්කෘතියේ පොදු ලක්ෂණයක් වූ නිෂේධන ප්‍රියතාව සිංහල සංස්කෘතියේ ද අනාදිමත් කාලයක සිට විද්‍යමාන වන්නේ ද? යන්න ය. මෙම පර්යේෂණයේ ගැටලුව වන්නේ අනුරාධපුර යුගයේ ස්වාධීන වූ සමාජීය කාව්‍ය සම්ප්‍රදාය වන සීගිරි කාව්‍යවල නිෂේධනය (Negative) පිළිබඳ සෞන්දර්ය තර්කනය කෙසේ වන්නේ දැයි අධ්‍යයනය කිරීමයි.

## 2. පර්යේෂණ ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණයක් වන මෙම අධ්‍යයනයේ දී විශ්ලේෂණාත්මක ක්‍රමවේදය යොදාගන්නා ලදි.

අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමවේදය (Content Analysis) එහි දී බහුල ව භාවිත කෙරිණි. උද්ගාමී ක්‍රමය හෙවත් පහළ සිට ඉහළට නිගමන උත්පාදනයේ දී සීගිරි කාව්‍ය නිරීක්ෂණයෙන් නිගමන ගොඩනගන ලදි. තව ද සිද්ධි අධ්‍යයනයේ න්‍යායික දැනුම මත පදනම් ව නිගාමී ක්‍රමයෙන් ඉහළ සිට පහළට තර්ක කිරීමෙන් ද විශ්ලේෂණ කටයුතු සිදු කෙරිණි. ද්විතීයික මූලාශ්‍රය බහුල ව යොදාගත් අතර ශාස්ත්‍රීය ග්‍රන්ථ, පර්යේෂණ පත්‍රිකා, පුවත්පත් ලිපි හා සම්මුඛ සාකච්ඡා ද අවශ්‍ය පරිදි යොදාගන්නා ලදි. දැනට ප්‍රකාශිත සීගිරි කවි 1 සිට 60 දක්වා කාව්‍ය සමූහය නියැදිය වශයෙන් භාවිත කැරිණි.

## 3. ප්‍රතිඵල හා සාකච්ඡාව

සීගිරි කවිවල අභ්‍යන්තර අර්ථ කියවීමේ දී කවියේ මුඛ්‍යාර්ථය නිෂ්පාදනය උදෙසා නිෂේධනාර්ථයෙහි ඇති දායකත්වය විශාල ය. ඒ ඒ කවිවලට අර්ථ ගොඩනැගීමේ උදෙසා අස්ත්‍යර්ථයට වඩා නිෂේධනාර්ථය ඵලදායක අයුරින් කවීන් විසින් භාවිත කර තිබේ. පළමු සීගිරි කවිය වන **එළනෙලකුලිය** නම් ස්ථානයෙන් පැමිණි **මැටි** නමැත්තා ලියූ කවිය විශ්ලේෂණයේ දී කවියා කියනුයේ රන්වන් තැනැත්තියගෙන් වචනයක් නොලැබුණු බවයි. “බෙයන්ද් අවැජ් නොලද් එක් ගීයක් කියී මා බසක් රන්වනැන් වනැන් බැලිම් අසරි සිහිගිරි” (Sigiri Graffiti,1956) රන්වන් තැනැත්තියගෙන් ගීයක් නොලැබීම ප්‍රධාන කිරීම මෙම කවියේ නිෂේධනාර්ථය වේ. සීගිරි ග්‍රැෆිටි කෘතියේ සංගෘහිත දෙවැනි කවි අංකය හිමි නැගෙනහිර දෙස වාසය කළ මෙයල් බතගේ දෙවැනි කවියේ නිෂේධනාර්ථය වනුයේ මේ රන්වනුන් කතා නොකළ හෙයින් රජතුමා මිය ගිය බවයි. “බෙයන්ද්හි රන්වනැන් අන්ද්වය් මියැ ගියේ රජ් මහනෙල් අත්නි ගත් මෙ හිමබුයුන් නොබුණුයෙන්” (Sigiri Graffiti, 1956) සෙන්බො දෙවල නම් කවියා ලියූ පස්වැනි අංකය හිමි කවියේ නිෂේධනාර්ථය ගම්භීරාර්ථධාරී ය. කවියාගේ ප්‍රකාශනය වනුයේ අපගේ සිත ඉතා යහපත් ව පැවතියේ දැයි ද යන ප්‍රශ්නයයි. එසේ යහපත් ව පැවතියේ දැයි විමසන්නේ මහනෙල් මල් ගත් රන්වන් තැනැත්තියන් බැලීමේ දී නොවේ. එම තැනැත්තියන් පසුව සිහිපත් වීමේ දී සිත යහපත් ව පැවතියේ දැයි ද යන්න ය. “සිතහි යහපත් වි ද බලය මෙහි රනවනබුන බලත නො මෙ ජතුමහ සිත ජතුමහ මෙ සිහි වන කල” (Sigiri Graffiti, 1956). කවියා නැවත අවධාරණ කරන්නේ අප අපගේ සිතෙහි ස්වභාවය වඩාත් හොඳින් දන්නේ ප්‍රධාන සිදුවීම ඉකුත් ව පසුව එම සිදුවීම සිහිපත් වන විට දී බව ය. එය අර්ථවත් වන කොටස වන්නේ ‘බලත නො මෙ ජතුමහ සිත ජතුමහ මෙ සිහි වන කල’ යන පද්‍ය කොටසින් ය. ජතුමහ යන වචනාර්ථය වනුයේ දතුම්හ යන අර්ථය ය.

අම්බගණවතු ප්‍රදේශයෙන් පැමිණි බුද් නමැති කවියා ලියන ලද හයවැනි කවියේ නිෂේධනාර්ථය වන්නේ රන්වන් තැනැත්තියන් කතා නොකළ මුත් මහනෙල් මල් ගෙන ඇති හෙයින් සිත ඇදගන්නා බව ය. “ අදනෙ සිත ම කත මෙ මෙහි නොමෙ බිණි වි ද තෙපුල් සිත අදනු බණනා බන්දු මහනෙල් ගෙනැ ඇති හෙයින්” යන්න ය (Sigiri Graffiti, 1956). මය්ලි බොය් කවියා ලියන ලද දහවන අංකය හිමි පහත කවියේ නිෂේධනාර්ථය තැන් තුනක දී අවධාරිත අවස්ථාවකි. අසද්බද හෙවත් අශ්‍රද්ධාවන්ත තැනැත්තිය වශයෙන් දක්වමින් පළමු නිෂේධනාර්ථය කවියට ගෙන එයි. අශ්‍රද්ධාවත් තැනැත්තිය යන නිෂේධනාර්ථයෙන් සජීවී අර්ථයකින් සීගිරි සිතුවම් හී නිරූපිත රන්වනුන්ට අමතන්නට මය්ලි බොය් කවියා උත්සහ කරයි. ආ අයට නො බැණ හෙවත් කතා නොකරන බවත් නුඹගේ පළමු ප්‍රියයා මිය ගියේ මෙලෙස කතා නොකර සිටීමෙන් යැයි ද එම මියැදීම දැන් පැමිණ සිටින්නන්ට ද හිමි කර දෙන්නේ දැයි ධ්වනිත කරන්නට නිෂේධනාර්ථය යොදා ගනියි. “කිනෙන් අසද්බද ආයුන්නහට් නො බණත තොප පැරැ පියා මළ නො එ මළ තද්ළඇත්තයිනට්” (Sigiri Graffiti, 1956). තද සිත් ඇත්තන් නිසා ඔහු මළේ නොවේ ද? යන ප්‍රශ්නාර්ථයෙන් කවිය නිෂේධනාර්ථයකින් ප්‍රශ්නයකින් ම අවසන් කරයි.

දොළොස් වැනි අංකය හිමි පොයල් නමැති යුද සෙනෙවියා විසින් ලියන ලද කවියයි. මරණය ගැන පවා පුදුමයක් නොවේ යැයි කියන නිෂේධනාර්ථය මගින් මූර්තිමත් කරන්නේ රූමත් කතුන් විසින් සිත සතුටු කිරීමට ය. “බෙයන්ද්හි දිග්නෙත් මහ වන් හෙළිල්ඹුයුන් අවුජ් තුට් සිත් කළ මරණෙක් දැකැ නො මුස්නෙය් මය්” (Sigiri Graffiti, 1956). දහ හතරවන අංකය හිමි සමනල නම් කවියාගේ කවිය මගින් පර්වතය නැගීමට පැමිණි අය සමග වචනයක් හෝ කතා නොකර රන්වනුන් තමන් වෙතට ඒ පිරිස ඇදගත් බව කියයි. “බලන් නැගියුන හය් නො මෙ බැණැ හින්දිමිනි වජන් සිරිබරින් තම වෙත සිකි හජනෙ හිමියබ් බෙයන්ද්හි” (Sigiri Graffiti, 1956). නිෂේධනාර්ථය ම අස්තයර්ථය ප්‍රකාශනය උදෙසා දායක කරගන්නා ආකාරය වන්නේ වචන නොබැණ සිටීමත් තමා වෙත රූපයෙන් ග්‍රහණය කිරීමත් ය.

අංක දහ හත හිමි පලාවතුවෙල ආරාමය තැනූ සගපල් බතී නමැත්තා ලියූ නිෂේධනාර්ථ දෙකකින් සමන්විත කවියකි. මෙකව විශේෂ වන්නේ නිෂේධනාර්ථය ම ප්‍රධාන කරගන්නා බැවිනි. කවියා රිසි සේ මේ රන්වන් කතුන් බැලූ බව දක්වතත් මෙළඳුන් කතා නොකළා යන නිෂේධනාර්ථය පමණකින් නොනැවතී ඔවුන්ගේ ඇසිපිය සැලීමක් පවා නොමැත්තේ යැයි කියයි. “බෙයන්ද් ගොසින් බැලුමො සිත් සුරුැස්නා සෙය් බණතුජ් නොබෙණෙනත් ඇසිපියෙව් එයුන් ලයු නැත්තෙ” (Sigiri Graffiti, 1956). අවසාන නිෂේධනාර්ථය පදනම් කරගෙන සීගිරියේ රන්වනුන් ජීවමාන වන

බවට ධ්වනිය මාර්ගයෙන් කියයි. එනම් ඇසිපිය සැලීමක් නැත්තේ නම් ඇසිපිය සැලීමට අවකාශයක් නැතහොත් ජීවමාන බවත් තිබිය යුතු වෙයි. අංක දහ නමය හිමි කවිය මහමෙත් නමැත්තා ලියූ කවියකි. මෙකව නිෂේධනාර්ථය කවිය අවසානයේ පමුණුවනු නිරීක්ෂණය වේ. "තනරන්මලී වෙණ අතනි ගත් හො රන්වන් ලි නිරිදු මෙළෙන් එකල් නො මෙ බෙණෙයි අන් නන හය් යාවත්" (Sigiri Graffiti, 1956). පළමුවෙන් කවියේ දී සහෘදයාට සම්මුඛ කරන්නේ අස්ත්‍යර්ථයෙන් යුතු වර්ණනාවකි. එනම් රන් මලකින් පියයුරු සදා වීණාව අතින් ගත් ඒ රන්වන් ලිය රජතුමා මිය ගිය හෙයින් කිසිවකු හා කතා නොකරන බවට නිෂේධනාර්ථය දක්වයි.

අංක විසි දෙක හිමි මයල නමැත්තාගේ කවිය විශේෂ නිෂේධනාර්ථයක් හිමි කවියකි. සීගිරියේ රන්වනුන් රජතුමා මියගිය පසුව ද වාසය කරන්නේ මනා මිනිසෙක් තවමත් නොදැකි නිසා ය. "මළ නොමියයය්හී වසතුජ් මෙතෙක් කල්හි නොදක්මො මනා මිනිසක් වී පව් වසන්නෙය් තෙජ්" (Sigiri Graffiti, 1956). මෙකව නිෂේධනාර්ථය පෝෂණය කරන්නේ පරිපූර්ණත්වය සහිත මිනිසකුගේ අවශ්‍යතාවයි. එහෙත් එම අවශ්‍යතාව මෙතෙක් පූරණය වී නොමැති බව දක්වයි. එසේ අපේක්ෂිත පරිපූර්ණත්වය හිමි මිනිසෙකුගේ ලක්ෂණ හා ස්වරූපය කෙසේ දැයි යන්නට ඉඟියක් සපයයි. එනම් ඔහු හෙවත් සීගිරිය තැනූ රජතුමා ය; මනා මිනිසෙකු වූයේ උහු ය. පරිපූර්ණ ජීවිතයක් ප්‍රතිපාදනය කර විස්ම පත් කලා හා මාලිග ව්‍යුහයක් තැනූ කාශ්‍යප මනා මිනිසකු වූයේ ඇයි දැයි යන්න ධ්වනිය වශයෙන් මතු කරන කවියකි. නිෂේධනාර්ථය එකිනෙකට වෙනස් ව භාවිත කිරීමේ හැකියාව මෙකව පැහැදිලි ව සාක්ෂාත් කරයි.

කවිය ආරම්භයේ ම සඳහන් නිෂේධනාර්ථ ප්‍රකාශන ශක්තිය කවිය පුරාවට අවසානය තෙක් රැගෙන යමින් කාව්‍ය පුරා රසය ඇති කරන්නට අංක විසිතුන හිමි කවියා සමත් වෙයි. නිෂේධනාර්ථය උදෙසා භාවාතිශය ලිවීමක් දක්නට ලැබීම මෙකවියෙහි විශේෂතාවකි. ඇය අණ කර තමා මරණයට පත් කරන තාක් කවියාට හෝ කථකයාට මරණයක් නැති බව පැවසීමෙන් ගැහැනිය හා පිරිමියා අතර ඇති මානසික සම්බන්ධය හා ආදරය එමෙන් ම බැඳීම්වල ඇති අතිසංකීර්ණ ස්වභාවය ප්‍රතිනිර්මාණය කරයි. කායික මරණයට වඩා මිනිසෙකුගේ මානසික මරණය ප්‍රබල නොවන්නේ ද යන ප්‍රශ්නාර්ථය නැගීමට හැකි හා අර්ථකරණය කළ හැකි කවියකි. ඇය කෙරෙහි ඇති ආදරය හා නුරාව තමන් කෙරෙන් විගලිත වේය හෝ අහිමි වේය යන බිය නිසා දිවි නැසෙයි යනුවෙන් නැවතත් නිෂේධනාර්ථය සපයන්නේ වෙයි.

"නො ජ මරණ තොමො අන දි නො මරනා තෙක්නි
ජිවි නහෙයි තොමො නුරා මා යෙවෙන බියෙනි
ඇතුළතිනි ජු බැහැරියෙන් එකවට ගතනි
අබු මිනිසුන් ඉසිලූ කුළ පීනු සෙයිනි " (Sigiri Graffiti, 1956).

අභ්‍යන්තර හා බාහිර වශයෙන් මිනිසෙකු ගැහැනියක හා බැඳීම විග්‍රහ කරන කවියා සමාජීය වශයෙන් ඇති බැඳීමට වඩා ආදරය කොතරම් තීරණාත්මක ව ප්‍රේමයක දී වැදගත් වන්නේ ද යන ප්‍රශ්නාර්ථය නගයි. අවසානයේ දක්වන ගල් කුලකින් පෑනීම යනු ස්වාභාවික මරණයක් නොවන වේදනාත්මක මරණයක් හිමි බවත් එය තවත් ක්ෂණ මොහොතකින් ලැබීමට නියමිත බවත් 'පීනු සෙයිනි' යන්නෙන් දක්වා ඇති අතර ප්‍රේමයක දී එබඳු සියදිවි නසාගැනීමක් කොට ගත නොහැකි බවත් සිය ජීවත්වීම ප්‍රේමය හා බැඳී පවත්නා බවත් විශද වේ.

අංක 26 හිමි රුහුණු පෙදෙසින් පැමිණි දළසිව කවියාගේ කවියේ අස්ත්‍යර්ථය වන්නේ ඔවුන් දර්ශනයට නැතහොත් බැල්මට ලක් වීමයි. එනමුත් නිෂේධනාර්ථය වන්නේ රන්වනුන් කථකයා සමග කතා නොකිරීමයි. "ඇවිජ් මුයුන් බලත් බෙයන්ද් කිස්හි රන්වනුන් බැලුම් මුත් අන් තෙපුල් නොදුන් නුයුනින් නිසසල" (Sigiri Graffiti, 1956). බැල්ම පමණක් මුත් ඉන් එහා යම් දෙයක් නොවූ බව දක්වන්නේ සියුම් උත්ප්‍රාසයක් නිෂේධනාර්ථයට එක් කරමින් ය. ඇස්වලින් පවා නිසංසල වී සිටින බවත් කවියා දක්වයි. කසබල කවියාගේ කවිය සීගිරි කාව්‍ය අතර 31 අංකය හිමි කවිය මෙන් ම නිෂේධනාර්ථවාදී ප්‍රශ්නාර්ථයක් නගන කවියක් වෙයි."මෙහි බලත හිමබියො වෙත කා විසියො දත දෙනෙ රනවන මෙ සෙ කී වි සිත නො බැලියො ද කොට ඇස් තද" (Sigiri Graffiti, 1956). මෙහි රන්වන් ළඳුන් දකින විට ඔවුන් කවුරුන් හා වාසය කෙළේ ද යන ගැටලුව කථකයාට තිබේ. එසේ රන්වනුන්ගේ සිත කිය වූ හෙයින් ඊට අමනාප ව තද සිතින් නොබැලුවා ද යන නිෂේධනාර්ථවාචී ගැටලුව ඉදිරිපත් කරයි.

32 අංකය හිමි කවිය නිෂේධනාර්ථය ධ්වනිය ගොඩනැගීම උදෙසා යොදාගත හැකි ප්‍රපඤ්චයක් බව පැහැදිලි වන කිති මුගලන් වංශයේ කවියකු වන කිති ලියූ විශේෂ කවියකි. "ම සොව නිව ඇ මෙසෙයි දුදුළසෙල අඬදරිහි විසිය යහ අසරට නු කිම නින්ද නොගිය යහනෙයි" (Sigiri Graffiti, 1956). අස්ත්‍යර්ථය සේ ම නිෂේධනාර්ථයත් නිසි පරිදි එක්තැන් කර ඇති කවියකි. නිෂේධනාර්ථය සහෘදයා හමුවට රැගෙන එනුයේ ප්‍රශ්නාර්ථයක් මතු කරමිනි. මගේ ශෝකය නිවමින් ඈ බල කොටු පවුර අසල සිටියේ යහපත් සිටියේ යහපත් ආශ්‍රය සඳහා ම සිටි ඇය හේතු කරගෙන තමාට යහනෙහි නින්ද නොපැමිණුනේ ඇයි ද යන ගැටලුව නගයි. කවියේ නිෂේධාර්ථය මගින් කවියෙන් නොකියැවෙන ධ්වනියක් ගොඩනගන්නේ වෙයි. ධ්වනිය විග්‍රහ කිරීමේ දී අභිධා, ලක්ෂණා හා ව්‍යංඤ්ජනා වශයෙන් ව්‍යාපාර තුනක් දක්වයි. එම ව්‍යාපාර තුන විමර්ශනය කිරීම මූලික වශයෙන් කළ යුතු වන්නකි. අභිධා ශක්තියෙන් ලබා දෙන්නේ කවියක මූලික වූ ද

වාච්‍යාර්ථවත් වූ ද අර්ථයයි. එය කවියක මුඛ්‍යාර්ථය වේ. මෙම මූලික අර්ථය ඉක්මවා ගොස් ව්‍යංග්‍යය වශයෙන් හෝ වක්‍රෝක්ති වශයෙන් හෝ පවතින්නේ ලක්ෂණා ය (සේනානායක, 1969). අභිධා හා ලක්ෂණා අර්ථ ඉක්මවීමෙන් පසුව තෙවැනි වශයෙන් අර්ථ වන්නේ නම් එකී කාව්‍යයෙහි ධ්වනිය ප්‍රකාශිත වන අයුරු හඳුනා ගැනීමට හැකි ය. එම අර්ථ වන්නේ අභිධා හා ලක්ෂණා ද ඉක්ම වූ ව්‍යඤ්ජනා ව්‍යාපාරය ඇසුරු කර පැහැදිලි කළ හැකි අර්ථයි.

ධ්වනිය නියම වශයෙන් විග්‍රහ කළ නොහැකි බවත් එය අවබෝධ කරගත යුතු සහෘදය තත්ත්වයක් වශයෙනුත් අනිර්වචනවාදීහු පෙන්වා දෙති (සේනානායක, 1969). එනමුත් ආනන්දවර්ධන පැහැදිලි ව පෙන්වා දෙන්නේ ධ්වනිය පැහැදිලි ව පෙන්වා දිය හැකි තත්ත්වයක් බවත් අනිර්වචනීය තත්ත්වයක් නොවන බවත් ය. කවියක ධ්වනිය ගොඩනැගීම උදෙසා අත්‍යවශ්‍යයෙන් ම වාච්‍යාර්ථයෙහි පිහිට ලබා ගත යුතු ය. වාච්‍යාර්ථයෙහි උපයෝගී වැදගත්කම වන්නේ එය ව්‍යංග්‍යාර්ථය ගොඩනැගීමට දක්වන දායකත්වය අනුව ය. වාච්‍යාර්ථය කවියක නොවැදගත් අංශයක් වන්නේ වාච්‍යාර්ථයට ම එය සීමා වුවහොත් පමණි. ව්‍යංග්‍යාර්ථය සහිත ධ්වනිය මතු කිරීමට සමත් කාව්‍යයෙහි වාච්‍යාර්ථය අත්‍යවශ්‍යයෙන් විශ්ලේෂණයට ලක් කළ යුතු ප්‍රපඤ්චයකි. පදාර්ථය ස්වකීය ශක්තියෙන් වාක්‍යාර්ථය සපයයි. එය ඉටු වූ කල්හී පදාර්ථයෙහි වැදගත්කම නැති වී යයි. කවියක වාච්‍යාර්ථය ඉක්මවා දැකිය යුතු හා අභ්‍යන්තර ධ්වනියක් කවියෙන් ජනිත කිරීම සාකච්ඡාවට ගත යුත්ත වේ. වාච්‍යාර්ථය කෙරෙහි කැමැත්තක් ලාලසාවක් නොමැති එහි වන්නා වූ තථ්‍ය තත්ත්වය දකින්නා වූ සහෘදයාගේ සිතෙහි ව්‍යංග්‍යාර්ථයක් වේ නම් එම ව්‍යංග්‍යාර්ථය වහා බබළන්නට පටන් ගනී. ධ්වනියෙහි ස්වරූපය පැහැදිලි කරමින් ශබ්දාර්ථ දෙදෙනා අප්‍රධාන කරමින් ව්‍යංග්‍යාර්ථයක් පැහැදිලි කරයි ද එය ධ්වනිය වශයෙන් පැහැදිලි කිරීමට හැකි ය.

33 අංකයෙන් කර්තෘ අඥාතව දක්වන කවිය ද නිෂේධනාර්ථයකින් යුතු හා එම නිෂේධනාර්ථය විස්මසහගත කාව්‍යාර්ථයක් වෙතට පමුණුවන කවියකි. කථකයා කියනුයේ මා මේ කරනුයේ වරදක් වශයෙන් ප්‍රසිද්ධ බව ය. එසේ වුවත් රන්වනුන් විසින් පවසන වචන කථකයා විසින් පිළිනොගන්නා ලද වුවත් රන්වන් තැනැත්තියන් ස්වාමියා මිය ගිය හෙයින් එවිට මුදාහරින ලද වරලසෙන් ගිලිහුණු මල් අතට ගත්තා පමණක් බවත් දක්වයි. රන්වන් තැනැත්තියගේ වචන පිළිනොගැනීමත් ඇයට එම කලින් සඳහන් අර්ථයට දූරස්ථ වෙනත් යමක් ප්‍රකාශනයටත් කවියා උනන්දු වෙයි. සීගිරි සිතුවම් පිළිබඳ පවතින විවිධ අදහස් පිළිබඳ නිෂේධනාර්ථවත් ව ප්‍රතික්ෂේප කරන කවියා මෙළඳුන් සිය වරලසේ රුවාගෙන සිටි මල් අතට ගත් බවත් දක්වයි. ඉතා විශිෂ්ට අර්ථකථනයක් සීගිරි සිතුවම් විෂයයෙහි ලබා දුන් අර්ථකථනයක් බවට මෙම අර්ථකථනය දැක්විය හැකි ය. "මෙ පළ ද වරද ලෙද ම නොගත් කී වදන් තා අතින් ගිලිහුණ මල් ගත් මෙළෙන් වරල මුදත් හිමි" (Sigiri Graffiti, 1956). සීගිරි චිත්‍ර පිළිබඳ විවිධ වූ අර්ථකථන පළ කරන මතවාදීන් අතින් විමර්ශනයට භාජන නොවූ මතවාදයක් බව ද මේ පිළිබඳ පැහැදිලි ව කිව හැකි වෙයි. 36 වැනි කවියේ දී අන් සියලු කවීන්ට වෙනස් ව යමින් රන්වන් අත්වලින් මල් රැගෙන සිටීම සුදුසු නොවන බව කවියා දක්වන්නේ කවියේ ධ්වනිය වශයෙන් රන්වනුන් මල් රැගෙන සිටීමට තරම් රූප සෞන්දර්යයෙන් ඌන නැති බව කියන්නට මෙනි. "නැගි බැලූමො ලැ මීලැස්න එ ත ගී සුරතත්හි මල්දම් නො හොබියි කිසිසිලූ රන්වන්" (Sigiri Graffiti, 1956). 38 අංකයෙන් දක්වන කවිය තුන් ආකාර නිෂේධනාර්ථයක් එක මිටකට ගෙන මුදාහරින ප්‍රකාශන ශක්තියකින් හෙබි කවියකි. පළමු කොට ම කවියා ඇය දෙස නොබලන් යන අවධාරණය නිෂේධනාර්ථයෙන් සිදු කරයි. විවිධ වූ ජනයා මිය ගියත් ඇය දැඩි ස්වාභාවයක් ඇති තැනැත්තියක සේ දැනගත් බවත් කථකයා කියයි. තමා වැනි වූ මිත්‍රයෙකු සමඟවත් ඈ කතා නොකළ බව නිෂේධනාර්ථයෙන් දක්වා එනිසා ඇගේ ආශ්‍රය ප්‍රාර්ථනා කරගෙන නම් පර්වතය මුදුනට නොයා යුතු යැයි තෙවන නිෂේධනාර්ථය සපයයි."නො බලහි බල දති වි දළසබව ජන මළ ද වි නොබිණි අ සිකිනහට ම සෙ ගිරිහිස නොයන් අසරට" (Sigiri Graffiti, 1956). බහුල වූ නිෂේධනාර්ථ සිය කවියට අන්තර්ග්‍රහණය කරගත් නිර්මාණයකට උදාහරණ වශයෙන් ඉතා ශෝභමානය.

39 වන අංකය දරන කවිය ඉතා විශිෂ්ට කාව්‍ය රසයක් ජනිත කරන කවියකි. "සිකි සන්ද් බුණ බිණි යි එප උන්හි තබන්න ඇසි දිටියා සැමැගැ සිහි හය් නොවන්නෙක් අන්හි තබයි බිණුවත් කෙළියෙන් ඇති සැටි මෙය් දක්වන් දමක් කඩා හැත් නිගැළි පත් මහනෙල් කඬන්නෙ ද" (Sigiri Graffiti, 1956). මෙසේ නිෂේධනාත්මක ව අවවාදාත්මක ප්‍රකාශයක් කරමින් හොඳ සිහියකින් සිටින අයෙකුගේ ඇස වෙනත් වෙනත් දෑ කෙරෙහි යොමු කරවන බවත් කියා නැවත් එකිනෙකට සෘජු සම්බන්ධයක් නැති කාව්‍යාර්ථ දෙකක් නගයි. එනම් හාස්‍යයට මෙන් මේ අදහස කියූවත් ඇතාට තමන් බැඳ ඇති දම්වැල කඩා දැමූ අයුරින් මානෙල් මලක පෙති කඩා දමන්නට හැකි ද යන ප්‍රශ්නය නගයි. මුල් කාව්‍ය පාදයේ නිෂේධනාර්ථය මත පිහිටා අවසාන කාව්‍යාර්ථය තෙක් ඉතා ශක්තිමත් කාව්‍ය ශක්තියක් වෙතට එම නිෂේධනාර්ථ යොමු කිරීමට සමත් වෙයි. හතළිස්වන කවිය නිෂේධනාර්ථ තුනක් අන්තර්ගෘහිත තවත් ප්‍රබල කවියකි. රන්වන් තැනැත්තියගේ ඇස් මහනෙල් වුවත් යන රූපකය ඉදිරිපත් කර එයින් කථකයා පැහැදීමට පත් නොවූ බවට වන නිෂේධනාර්ථය ගෙන එයි. එසේ පැහැදීමට පත් නොවූයේ මගේ පූර්ව ආත්මභාවවල පින් මඳකම නිසා බවත් එනිසාම ඔබගේ කැමැත්ත මට නොදුන් බවටත් කවියා පවසයි. නිෂේධනාර්ථය මෙසේ

කවිවල බහුලව යොදා ගැන්මට බල පෑ චින්තනමය සාධකය පර්යේෂකයකුට වික්ෂිප්ත තත්ත්වයක් ඇති කරන තරමට නිෂේධනාර්ථ කථනය පොහොසත් වේ. "තොප නුයුන් මහනෙල් විය ද ම හෙ නෑ පැහැදියෙ ම නොකෙළෙයින් තමන් පින් දැන් මට නුදුන් බස" (Sigiri Graffiti, 1956). මෙම කවිය එම තත්ත්වය ඉතා ප්‍රබල ව ප්‍රතිදීප්ත නිර්මාණයකි.

සූක්ෂ්ම නිෂේධනාර්ථ කථනය ප්‍රධාන කරගත් කවියක් වශයෙන් 42 වන අංකය හිමි කවිය හඳුනාගත හැකි ය. රන්වන් කථක් කවියා ඇතුළු පිරිස දෙස බලන්නේ මඳ සිනාවක්වත් සහිතව නොවේ. මද සිනා නොමැති බැල්මක් පමණක් ම වී යැයි අවධාරණ කරයි. දිගු ඇසින් කතා කර අප අස්වැසීමට ලක් කරන්නැයි ඉල්ලා සිටිමින් වුවත් මෙම සීගිරිය බැලීමට පැමිණි හෝ සිතුවම්ගත කාන්තාවන් පර්වතය වෙත ආ අයට මුහුණ දී සිත ද දී තම සිත වෙත හෙවත් තමාගේ අදහස නොකියන බව දක්වයි. ඇය දැක පමණක් කරන්නට දෙයක් නැතැයි පවසයි. "දිග ඇසී මහනෙල් වනිනි! තොප වැහැසින් අප දැකුම නැතත් බැල්ම වියැ දිග ඇසින් බැණැ අස්වසන්නැ අම්බුයුක් පැනි පැනී මෙ ආවවුනට් දි මුහුණ් දි සිත කිසිත් නොබෙණෙ මන දැකැ අ කුමක් වන් කරන්නෙ" (Sigiri Graffiti, 1956). නිෂේධනාර්ථයෙහි සූක්ෂ්මාත්මතාව ඉතා හොඳින් ග්‍රහණය කරගන්නා කවියා නවෝත්පාදන කාව්‍ය හැකියාවක් වෙතට සිය කාව්‍ය ප්‍රකාශනය යොමු කිරීමට සමත් වෙයි. 43 වන අංකයෙන් ප්‍රකාශිත කවිය ද සීගිරියේ කතුන් කතා නොකරන බවට වන නිෂේධනාර්ථයකින් යුතු කවියකි. "නො මෙ බෙණෙත් " (Sigiri Graffiti, 1956). 44 වන අංකයෙන් ප්‍රකාශිත කවියේ ආරම්භක පදය ම නිෂේධනාර්ථය ප්‍රධාන කර ගත්තකි.

"නොහි ද කසුන්ගිරිරද් අප සිරිලක් සිහිගිරි පසු
එන්සිය අග්නන් සග යන්නා කෙළෙ පසු
එඩිරුපු දප් බින්දලය් අතළෙ නැගැ බෙයද් ආ හිසු
වහසින් තම මිලියෙන් ඇස කළෙ සිට අග්නන් ම
දසු" (Sigiri Graffiti, 1956).

අපගේ ශ්‍රීයෙන් ශෝභමාන වූ සිහිගිරිය නිසා මහා මේරු පර්වතය පවා පසු බෑමේ නොවේදැයි යන ප්‍රශ්නාර්ථය නගයි. තව ද පන්සියයක් වූ රන්වනුන් විසින් දෙව්ලොව බලා යන්නවුන්ගේ ගමන පවා ප්‍රමාද කළේ යැයි දක්වයි. මෙම නිෂේධනාර්ථය පෙරදිග කාව්‍ය සම්ප්‍රදායන්ගේ කවිසමයන් වෙතින් නිපදවා ගත් නිෂේධනාර්ථයකි. බහුල ව මහා මේරුව සමග විවිධ වස්තූන් හා තත්ත්වයන් යොදා ගැනීම පොදු තත්ත්වයකි. මෙකවියෙන් ප්‍රකාශිත දෙව්ලොව යන්නන් ප්‍රමාද කිරීම බෞද්ධ නිෂේධනාර්ථවාදී සංස්කෘතික බලපෑමෙන් කවියා වෙතට පැමිණි කාව්‍ය සංකල්පයක් බව පැහැදිලි ව ම කිව හැකි ය. එමගින් විවිධ ලෞකික බැඳීම් මගින් ප්‍රමාද භාවයට පුද්ගලයා හෙළනු ලබන්නේ ය යන බෞද්ධ සංස්කෘතික පිළිගැනීම යොදා ගැනීමක් වශයෙන් කිව හැකි වේ. එය ද යොදාගෙන ඇත්තේ නිෂේධනාර්ථය හෙවත් පමා කිරීම ප්‍රකාශනය මගිනි.

45 වන කවියේ නිෂේධනාර්ථය යොමු වී ඇත්තේ රන්වන් තැනැත්තියක් කෙරෙහි ය. ඔහුට සීගිරි සිතුවම්හි නිරූපිත ළඳුන් දකින්නට ආශාවක් ඇති වී නැත. ඔහු ආශා වී ඇත්තේ සිංහ ස්වාමියා හෙවත් සිංහ රූපය බැලීමට ය."නැගි ඇති බලනට බැලිම් සිහිමියන් සිහිගිරි, මනදොළ පුරය් ඇති බලනරිසි නො වෙ බෙයන්ද් රන්වන්" (Sigiri Graffiti, 1956). කාව්‍ය චින්තනයේ පවතින සාපේක්ෂ ස්වරූපය අවබෝධ කර ගැනීමට ද මෙම නිෂේධනාර්ථවත් කවිය උපයෝගී කරගත හැකි උසස් කාව්‍යයකි. 46 වැනි අංකයෙන් ප්‍රකාශිත බඩී දාපුල් නමැති ඈපා කවියාගේ කවිය විශිෂ්ට නිෂේධනාර්ථයකින් යුක්ත ය. අපගේ සීගිරි නුවර බලා කිසිත් කතා නොකර මුවෙන් නොබැණ නිශ්ශබ්දව යැන්නැයි කවියා අයැද සිටියි. සීගිරි පර්වතයේ සිතුවම් කළා වූ රන්වනුන් ඒ සිටි අයුරින් ම කිසිවක් කතා නොකර සිටී යැයි කියයි. එසේ සිටින්නේ නම් තව දුරටත් කතා කිරීමේ අර්ථයක් නැත."බලා නො මෙ බැණැ යන් නවර් අප සිහිගිරි, නොබෙණෙත් මීලැස් ලෙය් කළ කළ වනින් මෙ තමන්" (Sigiri Graffiti, 1956). එහෙත් කවියා සිය කවියේ දී තමාගේ නිශ්ශබ්දතාව බිඳ ඇති බව පැහැදිලි වේ. ඒ මෙම නිෂේධනාර්ථය සහිත කවියෙනි.

50 වන අංකයෙන් ප්‍රකාශිත කවිය වූ කලී කාව්‍යාර්ථයක් දක්වා නිෂේධනාර්ථයෙන් එම කාව්‍යාර්ථය උත්සන්න කර ප්‍රබල කාව්‍යාර්ථයක් බවට පත් කරන කවියකි."තොප නුයුන මිණිවිට්නි වැම්හෙන පැහැ දිසෙය්, නො කෙළෙ තමන් තෙමම් එ ඉන් දනිම් තොප සුරබව" (Sigiri Graffiti, 1956). මැණික් පහනකින් වැගිරෙන ආලෝකයක් මෙන් රන්වන් තැනැත්තියගේ ඇස් දිදුලන බවත් එම ඇස්වල ශෝභාව ආයාසයෙන් ගත්තක් නොවන බවත් නිෂේධනාර්ථයකින් කවියා මෙහි දී ප්‍රකාශ කර ඇත.

51 කවිය පරිපූර්ණ නිෂේධනාර්ථ කාව්‍ය රචනයෙහි මහත් ඵල ළඟා කරගත් කවියකි. කවියාගේ සිත පූර්ණ වශයෙන් ඇය කෙරෙහි යොමු විය. එය තමාගේ නෙත් ඈ විසින් ලබා ගැනීමකි. එනමුත් ඈ කථකයාම ප්‍රියයා වශයෙන් පිළිනොගත්තේ යැයි නිෂේධනාර්ථයෙන් කියයි. තමා පමණක් නොව රජතුමා පවා ඇය පිළිනොගෙන තිබේ. දෙවැනි නිෂේධනාර්ථය කවියේ අර්ථය තීව්‍රව ගොඩනගයි. " දකුත් නැමී සිත ගත නෙත ගත කත, ළ නො පෙරෙ ජලගත දැකැ ම නොගත, සැබැවැ රජක් නො වි ගත තදගල ගත, බල මගයන්නො යති එතිය නුමුත" (Sigiri Graffiti, 1956). කවියා ද පිළිනොගත් රජතුමා ද පිළිනොගත් ඇය ව තද පර්වතයක් විසින් පිළිගෙන ඇත. අප්‍රාණවත් වූ පර්වතය අස්ත්‍යර්ථය වෙත කැඳවමින් ප්‍රාණවත් ජීවය සහිත කථකයා හා රජතුමා පිළිනොගැනීම විරෝධාභාසය සහිත කාව්‍ය

ලක්ෂණයකි. තව ද කථකයාටත් රජුටත් පොදු වූ රන්වනගේ ක්‍රියාකලාපය ඉදිරි කාලයේ අනාගතයේ ද නිසැක ව ම හිමි වනු ඇත. ඇය ද පරාජිත නොවී දිගින් දිගට පවතින බව දක්වයි.

54 වන කවිය ගැමි කවියකු වන අග්බොයා රචනා කරන්නේ නිෂේධනාර්ථය ම කවියේ ආරම්භය වශයෙන් ගනිමිනි. කවියා කථකයා ආමන්ත්‍රණය කරමින් කියනුයේ ඔබ පැමිණි අනෙක් අය හා එක්වන විට සිතෙහි නොසඳහන් ව යනු ඇති බවයි. එසේ ද වුවත් මෙම රන්වනුන් මෙතැන තබා වෙනත් තැනකට යාම ඉහළ තිබෙනා පර්වතයක් වෙතට දිවීමක් තරමට අපහසු බවයි."නොසදහන් වැ යෙ මෙය අනුන් හය් එක්වන තා දුවය උඩගල යන මෙන් තබයි අන්දස යෙනු මෙහි" (Sigiri Graffiti, 1956). එනිසා මෙකව නිෂේධනාර්ථ ද්වයක් සංග්‍රහ කරන කවියක් වශයෙන් හැඳින්විය හැකි ය. 55 වන අංකයෙන් ප්‍රකාශිත කවිය නිෂේධනාර්ථ දෙකක් ප්‍රකාශිත කවියකි. සීගිරිය බැලීමට ගිය අය නැවත නැවතත් එය බැලීමට යන බවත් එය නියතයක් බවත් දක්වා අන් සියලු දෙය අමතක වුවත් මෙය අමතක නොවීමට කරුණු කිමදැයි විමසයි. බෞද්ධ භාෂා සංස්කෘතියේ නියතාර්ථයෙන් අදහස් ප්‍රකාශනය අඩු වුවත් මෙම කවියේ දී නියතාර්ථය යොදා ගෙන තිබීම විශේෂ ලක්ෂණයකි. "යෙනුයුන් නියත් ගියෙ පුන සිහි වෙමින් සිහිගිරි සිහිපත් කුමට් මෙ නො වෙය අන් සන්ද්හන් නො වැ ගියත්" (Sigiri Graffiti, 1956). අස්ත්‍යර්ථය උදෙසා නිෂේධනාර්ථය කවියේ දී යොදාගත් අවස්ථාවක් වශයෙන් මෙම කවිය නිදසුන් වේ. 56 අංකය දරණ කවිය ද නිෂේධනාර්ථයෙන් කියනුයේ මහනෙල් මලෙහි වර්ණය ඇති තැනැත්තියගේ නවාතැන වන බෙයදට පැමිණ ඇයට ගීයක් නොදී ගියහොත් ඇය උදහස්භාවයට පත් වනු නො අනුමානය යන ඉදිරිපත් කිරීම සිදු කරයි."බෙයන්ද් අවුජ් අප මහනෙල්වනුන් නෙවෙස්නට් ගියක් නො දී ඇයට් ගියෙ නියත් හො උදහන්නෙතයි" (Sigiri Graffiti, 1956). මෙකව ද නිෂේධනාර්ථය අස්ත්‍යර්ථය සඳහා යොදාගැනීමට නිදසුන් කවියකි.

57 කවිය නිෂේධනාර්ථය සියුම් ව ගෙන පිරික්සා බැලිය යුතු කවියකි. සීගිරිය මුදුනට ගිය අය පහළට නොබැස්සේ වන බවත් එසේ සීගිරිය මුදුනට කුමක් කියන්නේ දැයි යහලුවාට කියන අතරෙහි ඔබ ද නොගොස් පරීක්ෂා කරන්නැයි ඉල්ලා සිටියි. එසේ ඔහු ද ගියහොත් ඔහු ද පැමිණෙනු සැක ඇති බව දක්වයි. "ගියහ බසින නැති සෙ වෙය් එ නැගි මිනිස්නට්, මී යනැ තබය් සිකිසන්ද් කුමක් කියන" (Sigiri Graffiti, 1956). නිෂේධනාර්ථය යොදාගන්නා නව ආකාර පිළිබඳ අතිශය ගම්භිර ස්වරූප සීගිරි ගීවල වන බවට මේ උදාහරණවල ස්වරූපකාරවලින් පැහැදිලි වේ. 58 වන අංකයෙන් ප්‍රකාශිත කවිය රකැසල් නම් කවියාගේ උත්ප්‍රාසවත් රසාර්ථ නගන කවියකි. "රකැසලු ගී, එවැනි දැයකට බියෙ නො බසන්න බණවන්නෙක් හෙ නො? බෙයන්ද්හි රන්වනුන් දක්නෙත් උකටලී" (Sigiri Graffiti, 1956). එම කවියේ නිෂේධනාර්ථය වනුයේ සීගිරියට නැග බැසීම අමතක වූ තැනැත්තෙක් යම් කිසිවකට බිය නොවේ ද යන පැනයයි. බෙයදෙහි රන්වන් තැනැත්තියන් දැක උකටලීභාවයට නොපැමිණෙන්නේ ද යන නිෂේධනාර්ථයත් ගෙන එයි. සීගිරියට නැගුණ සෞන්දර්යකාමියෙක් සිය බැඳීම නිසා ම පර්වතය හැර නොයන බවත් එවැනි නිර්භයභාවයක් ඇත්තකු රන්වනුන් දැක උකටලී වෙයි ද යන මතභේදාත්මක නිෂේධන සහිත ප්‍රශ්නාර්ථය රසිකයා ඉදිරියේ තබයි.

60 වන කවියේ රන්වන් කාන්තාවෝ බියපත් වූවාක් මෙන් කිසිත් නොකියා සිටින බවත් තමන් කතා නොකළේ වුවත් සියතින් මලක් ගෙන සිටින බවත් දැක්වෙයි. මෙකවිය ද ධ්වනිය කාව්‍ය ප්‍රකාශනය උදෙසා නිෂේධනයෙන් ප්‍රතිඵල ගත් අවස්ථාවකි. අතින් මල් ගෙන සිටීමෙන් කතා නොකළත් කතා කිරීමක් වන බව ධ්වනිය වශයෙන් කිව හැකි වෙයි. "බෙයදෙහි රන්වනුන් නො බැණ බෙයදෙහි සිටි මල ගෙනැ අතින් මෙ දිගැස් තමන් නො බෙණෙත ජු" (Sigiri Graffiti, 1956). මෙකවියෙහි නිෂේධනාර්ථ දෙක ම කාව්‍ය පාද දෙක අවසානයේ යොදා තිබේ. සීගිරි කාව්‍ය 687න් මුල් ම කාව්‍ය 60ක ප්‍රමාණය මත පමණක් පදනම් වෙමින් මෙම විමර්ශනය සිදු කරන ලද්දේ මෙම පර්යේෂණ පත්‍රිකාවේ ප්‍රමාණය සීමා සහිත වන බැවිනි.

## 4. නිගමන සහ නිර්දේශ

සෞන්දර්ය ප්‍රකාශනයේ දී නිෂේධනාර්ථය අස්ත්‍යර්ථයට වඩා දායක කර ගැනීමට සීගිරි කවීන් උනන්දු වී තිබේ. වඩාත් ප්‍රබල කාව්‍ය රසයක් ජනිත කිරීමට නිෂේධනාර්ථයෙන් සිංහල කවියාට හැකි වීම ගැඹුරු කාව්‍ය අර්ථ ප්‍රකාශනයට මාර්ගය විවර වීමක් වශයෙන් මෙම පර්යේෂණයේ දී පැහැදිලි විය. මෙම සෞන්දර්ය චින්තන ස්වරූපය මෙතෙක් ශාස්ත්‍රීය හෝ සමාජීය වශයෙන් සාකච්ඡාවට ලක් කර නොමැති සීගිරි කාව්‍ය සම්ප්‍රදායේ එනම් ස්වාධීන සිංහල කාව්‍ය සම්ප්‍රදායේ අනන්‍ය ලක්ෂණයක් වශයෙන් පර්යේෂණයේ දී නිගමන විය. කාව්‍යයන්ගේ අපූර්වතාවත් රමණීයත්වයත් ගම්භීරතාවත් ගොඩනැගීමට නිශේධනාර්ථය නව්‍ය ප්‍රවේශයන්ගේ ස්වාභාවිකව යොදා ගැනීමට සීගිරි කවීන් සමත් වී තිබේ. සියලු ම සීගිරි කාව්‍යවල නිෂේධනාර්ථ පිළිබඳ ප්‍රාමාණික සාකච්ඡාවක් සිදු කිරීම අත්‍යවශ්‍ය කටයුත්තකි. එසේ ම අද්‍යතන ශාස්ත්‍රීය කථිකාවේ ප්‍රමුඛ ලක්ෂණයක් වශයෙන් මෙම නිෂේධනාර්ථය පිළිබඳ කලාත්මක එළඹුමක් වශයෙන් දැක්විය හැකි ය. කාව්‍ය විචාරයේ ලා ප්‍රාමාණික විශ්ලේෂණ හා සංශ්ලේෂණ සිදු නොවීම බලවත් අඩුවක් වශයෙන් නිරීක්ෂණය වූ අතර මෙම අධ්‍යයනය එවැනි ශාස්ත්‍රීය වූ අධ්‍යයනයට ගත් එක් පියවරක් වේ.

## 5. ආශ්‍රිත ග්‍රන්ථ


කුමාරස්වාමි, එස්. (2019). *සෞන්දර්යවේදය හා කලා රසවින්දනය*, සූරිය ප්‍රකාශකයෝ.

නකමුරා, එච්. (2003). *පෙරදිග මිනිසුන්ගේ චින්තන විධි* (පරි. පී.බී. මීගස්කුඹුර), ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

නන්දසේන, එම්. (1963). *සීගිරි පද්‍යාවලිය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

පරණවිතාන, එස්. (2009) *සීගිරි ගී-වියරණ*, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.

පඤ්ඤාසාර හිමි, ඕ. (2004), *සිදත් සඟරා විමසුම*, කර්තෘ ප්‍රකාශන.

සේනානායක, ජී. එස්, බී., (1969) *ධ්වන්‍යාලෝක විවරණය*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.

Paranavithana, S. (1956). Sigiri Graffiti (Volume I), Oxford University Press.

Paranavithana, S. (1956). Sigiri Graffiti (Volume II), Oxford University Press.

Nakamura, H., & Wiener, P. P. (1968). Ways of Thinking of Eastern Peoples: India, China, Tibet, Japan. https://doi.org/10.1604/9780585349053

Lau, B. (2006). "Jane Austen and John Keats: Negative Capability, Romance and Reality", *Keats-Shelley Journal*, (55), 81–110. http://www.jstor.org/stable/30210646

Melaney, W. D. (1997). Art as a Form of Negative Dialectics: "Theory" in Adorno's Aesthetic Theory, *The Journal of Speculative Philosophy*, 11(1), 40–52. http://www.jstor.org/stable/25670205

Starr, N. C. (1966). Negative Capability in Keats's Diction, *Keats-Shelley Journal*, 15, 59–68. http://www.jstor.org/stable/30209856